රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 24/97

මගේඅංකය: 111/587ඊ/51ඩීසී
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1997.11.28 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

**සම්පූර්ණ පඩි සහිත අධ්‍යයන නිවාඩු ලබාගෙන ඇති අවස්ථාවලදී අත්සන් කළයුතු ගිවිසුම් හා බැඳුම්කර**
**<u>ආයතන සංග්‍රහය XV වන පරිජේදය</u>**

ආයතන සංගහ්‍රයේ XV වන පරිච්ජේදයේ 4:7 වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

4:7 ගිවිසුමේ කිසියම් කොන්දේසියක් හෝ නියමයක්හෝ කඩකල විට අභ්‍යාසය සඳහා දරණ ලද වියදම සම්පූර්ණයෙන් නිලධාරියා ආපසු ගෙවිය යුතු බවට එම ගිවිසුමේ විධිවිධාන සලසා තිබිය යුතුය. එසේ වුවත් අනිවාර්ය සේවා කාලය සම්බන්ධව පමණක් පහත සඳහන් ලිහිල් කිරීමට ඉඩ ලැබෙන පරිදි ද වගන්ති එම ගිවිසුමේ ඇතුලත් කළයුතුය. බැඳී ඇති අනිවාර්ය සේවා කාලයෙන් අවම වශයෙන් හරි අඩක් සේවයේ නොයෙදුණු නිලධාරින්ගෙන් ගිවිසුමේ සඳහන් සම්පූර්ණ දඩ මුදලම අයකළ යුතුය. ගිවිසුමේ සඳහන් සම්පූර්ණ කාලයෙන් හරි අඩක් හෝ ඊට වැඩි කාලයක් සේවයේ යෙදුනු නිලධාරින්ගෙන් අයකල යුත්තේ, අනිවාර්ය සේවා කාලයෙන්, සේවය කිරීම සඳහා තව ඉතිරිව ඇති කාලයට සමානුපාතිකව ගණන් බලන ලද මුදලකි.

"අභ්‍යාස සඳහා දරණ ලද වියදම" යනු අභ්‍යාසය සම්බන්ධයෙන් දැරීමට සිදුවූ වියදම වන අතර, එයට අභ්‍යාස කාලසීමාවේදී අභ්‍යාසලාභියාට ගෙවන ලද වැටුප සහ දීමනා,ගමන් සඳහා දරන ලද වියදම්, අභ්‍යාසය ලබන කාලයේදී අභ්‍යාසලාභියාට කිසියම් විශේෂ දීමනාවක් ගෙවන ලද්දේ නම් දීමනා, වෛද්‍ය වියදම්හි, අභ්‍යාසලාභියාට හෝ ඔහු වෙනුවෙන් හෝ එම අධ්‍යයන සහ අභ්‍යාස පාඨමාලාව සඳහා ගෙවන ලද ගාස්තු අත්තිකාරම් හෝ දීමනා වශයෙන් ගෙවන ලද මුදල් ඇතුලත් වේ.

02. මේ අනුව ආයතන සංග්‍රහයේ 8 පරිශිෂ්ඨයේ සඳහන් ගිවිසුමේ (13) ජේදය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත (13) ජේදය ඇමුණුම් 1 වශයෙන් ඇත.

03. මෙම චක්‍රලේඛය විධිවිධාන 1996.12.04 දින සිට බලපැවැත්වෙනු ඇත.

අ.කලේ/ (ඩික්සන් නිලවීර)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය.

## <u>1 ඇමුණුම</u>

**<u>(13 ජේදය)</u>**

(අ) ඉදින් එකී අභ්‍යාසලාභියා එම පාඨමාලාවේ කාලය ගතවී අවසන් වන්නට මත්තෙන් (4) ....... ගේ මතය පරිදි සතුටුදායක නොවන යම් යම් හේතූන් නිසා ස්වකීය ශිෂ්‍යත්වයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ තම ඉගෙනීම හා පුහුණුව අත්හැර දැමුවහොත්, මෙම ගිවිසුම යටතේ ලැබෙන සියලුම ඵල ප්‍රයෝජන ඔහුට අහිමිවුවා සේ සලකනු ලැබේ.එසේම ඔහු ඉල්ලා අස්වූ දිනය වනතෙක් එකී ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ආණ්ඩුව සහ ප්‍රදායක ඒජන්සිය විසින් ඔහු වෙනුවෙන් දරන ලද වියදම් ද සම්පූර්ණයෙන්ම ආණ්ඩුවට ආපසු ගෙවීමට ඔහු යටත්වන්නේය. තව ද ශ්‍රී ලංකාවට ආපසු එන ගමන සඳහා විධිවිධාන සලසා ගැනීමත්, ඒ ගමනේ යාන පත්‍රවල වියදම දැරීමත් ඔහු වියදම විසින්ම කළයුතු වන්නේය.

(ආ) ඉදින් එකී අභ්‍යාසලාභියාට ප්‍රදානය කරන ලද එකී අභ්‍යාස පහසුකම් ඔහුගේ වැඩ සහ/හෝ හැසිරීම සතුටුදායක නොවීමේ හේතුවෙන් ප්‍රදායක ඒජන්සිය විසින් අවලංගු කරන්නට යෙදුනහොත් හෝ, මෙහ 8(අ), (ඇ), (ඈ) හෝ (ඉ) යන වගන්ති යටතේ එකී අභ්‍යාසලාභියා ආපසු ශ්‍රී ලංකාවට කැඳවනු ලැබුවහොත් හෝ එවිට මෙම ශිෂ්‍යත්වය සඳහා එකී අභ්‍යාසලාභියා විසින් ආණ්ඩුවට ආපසු ගෙවිය යුතු වන්නේය.

(ඇ) ඉදින් එකී අභ්‍යාසලාභියා එම පාඨමාලාව ගිවිසුමේ සඳහන් කාලය ගතනීමට පෙර අවසන් වීමේ හේතුවෙන් ශ්‍රී ලංකාවට ආපසු එන ලෙස නියම කරනු ලැබූ විට එකී අභ්‍යාසලාභියා ශ්‍රී ලංකාවට ආපසු නොපැමිණියහොත් හෝ තම අධ්‍යයන හා අභ්‍යාස පාඨමාලාව අවසන් වූ පසු අවසන්වීමේ හේතුව මත නැවත රාජකාරි බාරගැනීමට අපොහොසත් වුවහොත් හෝ ආණ්ඩුව යටතේ නැවත රාජකාරි බාර ගැනීමෙන් පසු ඉහත සඳහන් පරිදි සිය රාජකාරි බාරගත් දින සිට යටත් පිරිසෙයින් අවුරුදු (5) .......... ක් වත් ආණ්ඩුවට සේවය කිරීමට අපොහොසත් වුවහොත් හෝ ඉහත සඳහන් පරිදි සිය රාජකාරි බාර ගැනීමෙන් පසු එකී අවුරුදු ........... ක කාලසීමාව ගතවන්නට පළමු ඔහු ආණ්ඩුව යටතේ ලබා ඇති පත්වීමෙන් ඉල්ලා අස්වුවහොත් එකී අවුරුදු (5) ........... ක කාලසීමාව ගතවීමට පෙර අකාර්යක්ෂමතාව නිසා හෝ වෙනත් කිසියම් හේතුවක් නිසා ඔහු සේවයෙන් පහකරනු ලැබුවහොත් නැතහොත් ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මෙම ගිවිසුමේ වෙනත් යම් කොන්දේසියක් පිළිපැදීමට ඔහු අපොහොසත් වුවහොත් හෝ එවිට මෙම ශිෂ්‍යත්වය සඳහා එකී අභ්‍යාසලාභියා වෙනුවෙන් ආණ්ඩුවට සහ ප්‍රදායක ඒජන්සියට දැරීමට සිදු වූ වියදමින්, අනිවාර්ය සේවා කාලයෙන් සේවය නොකරන ලද කාලයට ගිවිසුමේ සඳහන් දන්ඩන මුදලින් සමානුපාතික මුදලක් එකී අභ්‍යාසලාභියා විසින් ආණ්ඩුවට ආපසු ගෙවිය යුතු වන්නේය. මෙම ජේදය යටතේ අභ්‍යාසලාභියා විසින් ආණ්ඩුවට ආපසු ගෙවිය යුතු මුදල ආයතන ප්‍රධානියා විසින් තීරනය කරන අතර, එසේ තීරණය කරනු ලැබීමෙන් අනතුරුව අභ්‍යාසලාභියා වෙත ලිඛිතව දන්වනු ලැබේ.

කෙසේ වුවද අනිවාර්ය සේවා කාලයෙන් හරි අඩක්වත් සේවය කිරීමට අපොහොසත් වූ අභ්‍යාසලාභියා විසින් මෙම ශිෂ්‍යත්වය සඳහා එකී අභ්‍යාසලාභියා වෙනුවෙන් ආණ්ඩුවට සහ ප්‍රදායක ඒජන්සිය දැරීමට සිදුවූ සම්පූර්ණ වියදම එකී අභ්‍යාසලාභියා විසින් ආණ්ඩුවට ගෙවිය යුතු වන්නේය.